33 වන පිටෙන්

යා හැකි නුමුදු ඉර මැදියම වෙනුවෙන් පූර්ණ බටහිර ආරෙන් ලක්ෂ්මන් ජෝසප් ඩි සේරම් නිර්මාණය කල කුටීර සංගීතය (chamber music) තරම් සමනල සංධ්වනියේ සංගීතය සිනමාත්මක නැත. සිතට කා වදින්නේද නැත. සංබාරා චිත්‍රපය වෙනුවෙන් නදීක ගුරුගේ නිර්මාණය කල විශිෂ්ඨ සංගීතයද ඉතා සිනමාරුපිවූ බව අප අමතක කල යුතු නැත. මේ චිත්‍රපට දෙක තිර ගත වී දැනට කලක් ගතවී ඇතත් මා මේ සැසඳීම කිරීමට පෙළඹුණේ සමනල සංධ්වනිය චිත්‍රපටයෙහි සංගීතය සිංහල සිනමාවේ ප්‍රබල සන්ධිස්ථානයක් ස්ථාපිත කල පෙර නොවූ විරූ අපූරු සංගීතයක් ලෙස අගයමින් කෙරුණු වර්ණනාවලට ප්‍රතිචාරයක් ලෙසය. දර්ශන රුවන් දිසානායකගේ නිර්මාණ කුසලතා පිළිබඳව සැකයක් නැත. දිගටම නිර්මාණයෙහි යෙදෙන්නේ නම් කවර මාධ්‍යක් සඳහා හෝ කවර ශෛලියකින් හෝ වුවද ඔහු විසින් උසස් රසවත් නිර්මාණ අනිවාර්යෙන් බිහිවිය යුතුය. හැම දෙයක්ම වානීජකරණයට හසුවී සියලු කලාවන් විශේෂයෙන් සංගීතය හා සුභාවිත ගීතය උඩු යටිකුරු වී ඇති මේ යුගයේදී කට පුරා සම්භාව්‍ය හෝ කලාත්මකයැයි කිවහැකි සංගීත නිර්මාණයන් බිහි කිරීම සඳහා දිසානායක ප්‍රමුඛ ජෝසප් ඩි සේරම් නදීක ගුරුගේ හා නවරත්න ගමගේ වැනි සංගීතවේදීන්ට අවකාශයක් ලැබේවායි පතමි.

රුපියල් කෝටි හතරක් වැනි විශාල මුදලක් යට කිරීමෙන් පසුව චිත්‍රපටයක් දුවන්නේ නැත්නම් නිෂ්පාදක වරයාට මුහුණ පෑමට සිදුවන ආර්ථික අහේනිය සුළුපටු නොවන අමුතුවෙන් කිව යුතු නැත. එනිසාම චිත්‍රපටයකට යම් යම් බාල වාණිජ අංග ඇතුලත් කිරීමට බොහෝ සිනමා කරුවන් පෙළඹීම අප නිතර දකින ප්‍රවනතාවකි. සමනල සංධ්වනියෙන් චන්ද්‍රසිරි කර ඇත්තේද දිවිය හැකි හොඳ යයි කිව හැකි චිත්‍රපටයක් ඉදිරිපත් කිරීමය. එහි කලාත්මක ලක්ෂණ ඇතත් චන්ද්‍රසිරි යම් යම් කුසලතා පෙන්වා ඇතත් එහි සමස්ථය විශිෂ්ඨ ගනයේ කලාත්මක චිත්‍රපටයකට සම කල නොහැකිය. සම්භාව්‍ය චිත්‍රපටයක් නිර්මාණය කිරීමට චන්ද්‍රසිරිට අවශ්‍යතාවක්ද නොතිබුන බව කතාව හා තිර කතාව විචාරාත්මකව සෝදිසි කරන විට අපට පෙනී යයි. කාන්තාරයට තුත්තිරි ගසත් ගසක් යයි කීවා සේම කලාත්මක නිර්මාණ බිහි නොවන මෙවැනි නිසරු යුගයක සමනල සංධ්වනිය අපූර්ව කලාත්මක නිර්මාණයක් ලෙස තක්සේරුවට ලක්වීම නූතන කලාවත් සම්භාව්‍ය සිනමාවත් වැටී ඇති අභාග්‍ය සම්පන්න තත්වය පෙන්වන කැටපතක් වැන්න.








